**වනසත්ව සංරක්ෂණ අරමුදල - 2013**

**----------------------------------------**

වනසත්ව සංරක්ෂණ අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ (469 අධිකාරිය) 71 (2) (උ) වගන්තිය යටතේ සම්පාදිත වනසත්ව සංරක්ෂණ අරමුදලේ අංක 11 (අ) දරන රෙගුලාසිය, සහ 2009 අංක 22 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනතේ 55 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානයටත් විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මගේ විගණනය මත පදනම් වූ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට වනසත්ව සංරක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කර ඇති බව දක්වා ඇති නමුත් රු.1,074,196 ක උපචිත වියදම් හා කොන්ත්‍රාත් ගෙවීම් මත රඳවාගත් රු. 7,231,993 ක රැඳවුම් මුදල් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට කරන ලද භෞතික තොග සත්‍යාපනයට අනුව අලිවෙඩි තොගයෙහි රු.760,835 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. තොග ඌනතාවය පොත්වල ගලපා භෞතික තොගය මූල්‍ය වාර්තාවල පෙන්නුම් කරනු වෙනුවට තොග පොතේ ශේෂය මූල්‍ය වාර්තාවල දක්වා තිබීම නිසා තොග වටිනාකම රු.760,835 ක් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) කිරිපිටි තොග | 2,304,528 | භෞතික තොග සත්‍යාපන වාර්තා |
| (ආ) ඖෂධ තොග | 2,860,000 | - එම - |

### 2.3 ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්

ගෙවියයුතු ප්‍රසාද දීමනා රු. 30,686,737 ක් හා ගෙවිය යුතු සේවා ගාස්තු රු. 4,669,111 ක් වර්ෂ 03 කට වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 454 | ගබඩාවට ලැබෙන සියළුම භාණ්ඩ තොග ලේඛනයට ඇතුළත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 09 කදී මිලදීගත් රු.3,773,894 ක ඖෂධ වර්ග 45 ක් තොග ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 755 | ගබඩා භාර නිලධාරියෙකු මාරුවන අවස්ථාවේදී ඊළඟ නිලධාරියාට භාණ්ඩ භාරදෙන විට පොත් තුළනය කර භාණ්ඩ පිළිබඳ වාර්තාවක් සකස්කර ඌනතාවයක් වේනම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට හා විගණනයට දැන්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ රු. මිලියන 530.4 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. මිලියන 442.2 ක අතිරික්තයක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 88.2 ක වර්ධනයක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේදී උද්‍යාන පිවිසුම් ගාස්තු ආදායම් රු.මිලියන 152.15 ක් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදලේ 2012 වර්ෂයේ ආදායම රු. මිලියන 733.4 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 942.4 දක්වා රු.මිලියන 209 කින් හෙවත් සියයට 28.50 කින් වැඩිවී තිබුණි. 2012 වර්ෂයේ වියදම රු.මිලියන 291.17 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු. මිලියන 412.01 ක් දක්වා රු.මිලියන 120.84 කින් හෙවත් සියයට 41.5 කින් වැඩිවී තිබුණි.

(ආ) විෂයය අනුව විශ්ලේෂණය කළ විට සමාලෝචිත වර්ෂයේ සංචාරක නිවාස , දැයට කිරුළ, සිවිල් ආරක්ෂක දීමනා සහ උද්‍යානවල සංචාරකයින්ගේ හා සතුන්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් දැරූ වියදම් සියයට 100 කින් වැඩි වී තිබුණු අතර වෛද්‍ය සැපයීම් වියදම් සියයට 12.318 කින් වැඩිවී තිබුණි. මෙවැනි වැඩිවීමකට බලපාන ලද හේතු තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

**3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි**

සමාලෝචිත වර්ෂය තුළදී බාහිර ආයතන සහ පුද්ගලයන් විසින් දෙපාර්තමේන්තුවට විරුද්ධව අධිකරණයක නඩුවක් පවරා තිබූ අතර දෙපාර්තමේන්තුව විසින් බාහිර පාර්ශවයන්ට විරුද්ධව නඩු 661 ක් පවරා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 21 ක් බාහිර පාර්ශව වෙත පැවරූ නඩු වලින් දඩ මුදල් වශයෙන් අයකරගෙන තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

2008 – 2013 යන අවුරුදු 06 තුළ අලිවෙඩි මිලදී ගැනීම සඳහා රු.මිලියන 203.7 ක මුදලක් වියදම් කර තිබුණු අතර ඉන් රු.මිලියන 47.3 ක් සමාලෝචිත වර්ෂය තුළදී දරා තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අලිවෙඩි මිලදී ගැනීමට අදාල තාක්ෂණික පිරිවිතර හෝ අලිවෙඩි වලට අදාලව තිබිය යුතු ප්‍රමිතිය නිර්ණය කර නොතිබුණි.

(ආ) අලිවෙඩිල්ලක ශබ්දය කවර ඩෙසිබල් පරාසයක තිබිය යුතුදැයි පැහැදිළිව නිශ්චය කර නොතිබුණි. මේ නිසා අවශ්‍ය ඩෙසිබල් ප්‍රමාණය සත්‍ය වශයෙන් තිබේද යන්න පරීක්ෂා කර අලිවෙඩි වල ගුණාත්මක භාවය සහතික කර නොතිබුණි.

(ඇ) කුඩා අලිවෙඩි දැල්වීමේදී දෝෂ තිබෙන බවට 2013 ඔක්තෝබර් 25 දින පොළොන්නරුව සහකාර අධ්‍යක්ෂ විසින් අලිවෙඩි ඉල්ලුම් පත්‍රයෙහි දක්වා තිබූ අතර, එකී නොදැල්වුණු අලිවෙඩි සම්බන්ධයෙන් හා ක්ෂේත්‍රයේදී නොදැල්වෙන අලිවෙඩි සම්බන්ධයෙන් සහකාර අධ්‍යක්ෂ කාර්යාල වලින් වාර්තාවන් ලබාගෙන ඉදිරි කටයුතු සඳහා තොරුතුරු රැස්කර ලේඛන පවත්වා නොතිබුණි.

(ඈ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.1 (ඊ) වගන්තියට පටහැනිව රතිඤ්ඤා සහ ගිණිකෙළි කර්මාන්තයේ නිෂ්පාදකයින් ගෙන් මෙම අලිවෙඩි සැපයීම සඳහා අවුරුදු දෙකක පළපුරුද්දක් ඉල්ලා තිබීම හේතුකොටගෙන දිර්ඝකාලයක් එකම නිෂ්පාදකයෙකුට ටෙන්ඩරය ප්‍රදානයකර තිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වනසතුන් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම අරමුදලේ ප්‍රධාන කාර්යයක් වන අතර එයින් අවතැන්වූ අලිපැටවුන් රැකබලා ගැනීම සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සති 02 සිට අවුරුදු 05 දක්වා වූ අලි පැටවුන් සඳහා කෘත්‍රිම කිරි ලබාදීමේදී වයස, සෞඛ්‍ය තත්ත්වය, දියයුතු ප්‍රමාණයන් සලකා බලා නිසි ක්‍රමවේදයක් ආයතනය තුළ සකස් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ii) අලි පැටවුන්ට අවශ්‍ය කිරි ඇනවුම් කිරීම සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් සකස්කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී කිරි මිලදී ගැනීම සඳහා රු.මිලියන 31 ක් වැයකර තිබුණි.

(ආ) අරමුදල මඟින් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 14.2 ක පමණ මුදලක් ඖෂධ සඳහා වැයකළද පශු වෛද්‍ය කාර්යාල වලට ඖෂධ ලබාදීමේදී, කලින් නිකුත් කරන ලද ඖෂධ භාවිතය ඖෂධ ලබාදුන් සතුන් පිළිබඳ චර්යා සටහන්, කලින් ලබාදුන් ඖෂධ ලැබුණු බවට සනාථ කිරීම් පිළිබඳ වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ඇ) 2014 අප්‍රේල් 01 දින ස්ථානීය පරීක්ෂාවට අනුව වන උද්‍යාන වලට ඇතුල්වීම සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම විධිමත් කිරීම සඳහා පරිගණක ප්‍රවේශපත්‍ර  නිකුත් කිරීමේ ක්‍රමයක් හඳුන්වාදී තිබුණද එම පරිගණක පද්ධතිය අක්‍රිය කර ප්‍රවේශපත්‍ර වෙනුවට පොදු 172 රිසිට්පත් නිකුත්කර මුදල්  එකතුකර තිබුණි. මේ නිසා මුදල් එකතු කිරීමේදී වංචා සිදුවීමේ අවදානම ඉහළ තත්ත්වයක පවතී. උදාහරණ ලෙස වාහන ගණනාවකින් එක කණ්ඩායමක් පැමිණිවිට වාහන සියල්ලටම එක් කුවිතාන්සියක් හා බලපත්‍රයක් ලියනු ලැබේ.  එය එක් වාහනයකට පමණක් ලබාදෙන අතර අනෙක් වාහන වලට කිසිදු බලපත්‍රයක් හෝ වෙනයම් ලියවිල්ලක් නිකුත් කරනු නොලබයි. මේ නිසා වනය තුළදී විසිරියන වාහන පරීක්ෂාකර බලා එම වාහන වලින් ගාස්තු අයකරගෙන ඇත්ද යන්න ආරක්ෂක ගේට්ටුවෙන් පරීක්ෂා කිරීමට නොහැකි වී තිබුණි. එසේම වනෝද්‍යානය නරඹා පිටත්වන වාහන පරීක්ෂාකර බලා ඔවුන්ගේ ප්‍රවේශපත්‍ර (පොදු 172) නැවත එකතුකර ගැනීමක් සිදු නොකරන හෙයින් එම දිනය තුළ නැවත නැවත එම ප්‍රවේශපත්‍ර භාවිතා කිරීමට ඉඩකඩ අහුරා නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

වී විල සංචාරක බංගලාව රු.11,730,808 ක් වියදම් කර ඉදිකර තිබුණ ද 2014 සැප්තැම්බර් වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

**4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

අරමුදල මඟින් ක්‍රියාත්මක වූ හීන්වැව සංචාරක නිවාසය ඉදිකිරීම සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉදිකිරීම සඳහා රු. 1,081,295 කට වැය ඇස්තමේන්තුවක් සකස්කර තිබූ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.7 වගන්තිය ප්‍රකාරව සම්මත ශ්‍රම පිරිවැය, ද්‍රව්‍ය සහ පොදු කාර්ය පිරිවැය නිශ්චිතව හඳුනාගෙන ඇස්තමේන්තුව සකස්කර නොතිබුණි.

(ආ) ශ්‍රමය සඳහා ගෙවීම් කිරීමේදී ව්‍යාජ නම් භාවිතාකර රු. 83,600 ක මුදලක්  ගෙවා ඇති බව  හා කළවැඩ විස්තර නොමැතිව රු. 101,200 ක් ද ගෙවා තිබුණි. කම්කරුවන් 09 දෙනෙකු අඛණ්ඩව මුළු කාලයේදීම දිනපතා සේවයේ යෙදීම වෙනුවෙන් රු. 247,950 ක් වියදම් කර තිබූ අතර එය විගණනයේ දී පිළිගත නොහැකි අසාමාන්‍ය තත්ත්වයක් විය.

(ඇ) ද්‍රව්‍ය මිලට ගැනීම වෙනුවෙන් විගණනයට ඉදිරිපත් කළ රු.72,000 ක ලදුපත්  විගණනයට පිළිගත නොහැකි මට්ටමක පැවතුණු අතර දැව ආරක්ෂක, පිටත සහ ඇතුළත ආලේපන තීන්ත පිරිවැය ඇස්තමේන්තුවේ සඳහන් වැඩ සඳහා භාවිතා කළ යුතු සම්මත ප්‍රමාණයන් ඉක්මවා අසාමාන්‍ය ප්‍රමාණයක් රු.212,245 කට මිලදීගෙන තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිකිරීමට අදාලව භෞතික පරීක්ෂාවක් සිදුකර ඒ පිළිබඳව සහතිකයක් කළ යුතු වුවද ගෙවීම් කිරීමේදී ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2013 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය තුළ රු. 202,656,025 ක ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණද 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ විගණන නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උඩවලව ඇත් අතුරුසෙවණේ රු. 58,000 ක් වටිනා ටිකට් පොත් 16 ක් අස්ථාන ගත වීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) උප පත්‍රිකා පොත් පිළිබඳ දුර්වල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මන්නාරම කාර්යමණ්ඩල නිල නිවාස, වන අඩවි ආරක්ෂක කාර්යාලය හා කම්කරු නිල නිවස ඉදිකිරීම සඳහා රු. 8,630,360 ක වටිනාකමකට 2011 වර්ෂයේ දී ගිවිසුම් අත්සන් කර 2011 වර්ෂය අවසානයට පෙර වැඩ නිමකිරීමේ එකඟතාවය මත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. 1,933,200 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් ව්‍යාපෘතියේ වැඩ ආරම්භකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) වනසත්ව උද්‍යාන ආදායම් එකතු කිරීම
(ඇ) දඩ මුදල් එක්රැස් කිරීම හා ප්‍රසාද දීමනා ගෙවීම
(ඈ) සේවක මණ්ඩල කළමනාකරණය
(ඉ) ලිපි ලේඛන පවත්වාගෙනයාම
(ඊ) කොන්ත්‍රාත් පාලනය
(උ) තොග පාලනය